www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගැස්ට්‍රයිටිස් රෝගය පිලිබඳ සොයාගැනීමකට වෛද්‍ය විද්‍යාව පිලිබඳ නොබෙල් ත්‍යාගය

**Nobel Prize for Medicine for gastric ulcer breakthrough**

**පර්ලා ඇස්ට්‍රඩිලෝ විසිනි**
**2006 මාර්තු 06**

පසු ගිය දෙසැම්බරයේ දී ලොව දෙවන තැනට වඩාත්ම බහුල රෝගය වන ගැස්ට්‍රයිටිස්හි - ආමාශයික හා ජීර්න පද්ධතියේ තුවාලවල - බැක්ටීරීය පදනම අනාවරනය කල ඕස්ට්‍රේලියානු විද්‍යාඥයන් දෙදෙනෙකුට 2005 වසරේ වෛද්‍ය විද්‍යාව පිලිබඳ නොබෙල් ත්‍යාගය පිරිනමනු ලැබිනි. චිත්‍රපට හා සාහිත්‍යද ඇතුලත් ජනප්‍රිය සංස්කෘතිය දක්වා පැතිරුනු පූර්වයෙන් තිබූ අදහස් වලට අනුව මෙම තුවාල අවිධිමත් ආහාර ක්‍රම හෝ පීඩාකාරී ජීවන රටාවට සම්බන්ධිත විය. ගිලන් කරවන සුලු හා විහවාත්මකව මාරාන්තික වූ මෙම රෝගය සඳහා සාපේක්ෂ වසයෙන් සෘජු ප්‍රතිකාර ක්‍රම සඳහා මෙම නව සොයාගැනීම මගින් වග විවර කෙරිනි.

ජීර්න පද්ධතියේ තුවාල ඇති කරනු ලබන්නේ සර්පිලාකාර හෙලිකො බැක්ටර් පයිලෝරි නම් වූ බැක්ටීරියාව මගින් ය යන තම කල්පිතයට එරෙහි සැලකිය යුතු විරුද්ධත්වයකට මුහුන දීමට බැරී මෂෙල් හා රොබින් වොරන් යන විද්‍යාඥයන් දෙදෙනාට සිදු විය. රෝගයේ මෙම සරල එහෙත් නොතකා හැර තිබුනු හේතුව පිලිබඳ තම සාධනය තහවුරු කිරීම උදෙසා ඔවුන් දෙදෙනා දශක දෙකක් තිස්සේ වෙහෙස දරුහ. ඔවුන්ගේ සොයාගැනීමේ අර්ථභාරය ජීර්න පද්ධතිමය තුවාලවලට ප්‍රතිකාර කිරීමට වඩා දුර විහිදෙන අතර හෙලිකොබැක්ස්ටරි පයිලෝරි ආසාදනය හා සම්බන්ධ උදරීය හා ග්‍රසනීය පිලිකා වැලැක්වීමට හේතුවිය හැකි ය.

තුන්වන ලෝකයේ රටවල් තුල සියයට 90ක් ජනයා මෙම ආසාදනයට ගොදුරුව සිටිති. එක්සත් ජනපදයේ පමනක් අවස්ථා මිලියන 6.5ක් සමගින් දියුනු රටවල්වලින් 30 ක ආසාදන රේට්ටුවක් වාර්තා වේ. විශේෂයෙන්ම අධික ජනගහනය දුර්වල සනීපාරක්ෂක ක්‍රම හා දිලිඳුකම ඇතුලත්වන සමාජ ආර්ථික සාධක සමග ඉහල ආසාදන රේට්ටු සෘජුව ම බැඳී තිබේ. බොහෝ දෙනා පූර්ව ළමා වියේ දී ආසාදනයට ලක් වන නමුත් ජීවිතයේ පසු කාලයේ දී තුවාල සහිත රෝගීන් බවට වර්ධනය වන්නේ කොටසක් පමනි.

මෙම බැක්ටීරියාව පැතිරෙන ක්‍රමය තවමත් සම්පූර්නයෙන් තේරුම් ගෙන නැතත් විද්‍යාඥයින්ගේ විශ්වාසය අනුව එය මුඛ ස්පර්ශය හා අසූචි මිශ්‍ර ජලය මගින් ව්‍යාප්ත වේ. අධික ජනගහනය හා දිලිඳු බව සමග අධික ආසාදන රේට්ටු සම්බන්ධ වන්නේ ඇයි දැයි මෙමගින් පැහැදිලි කල හැකිය.

ජීර්න පද්ධතිමය තුවාල ගිලන්කාරී රෝගයක් විය හැකිය. මෙයින් පෙලෙන්නන්ට බොහෝවිට නිදන්ගත වේදනාවක් ඇති අතර ජීවිත අවදානමට - තර්ජනාත්මක ආමාශඅන්ත්‍රයික ලේ ගැලීම හෝ තුවාල සිදුරුවීම - මුහුන දෙති. මෙහි ගොදුරු බවට පත් වූවන් අතරට උදරීය තුවාලයක් මගින් ඇති වූ පිලිකාවකින් මියගිය නැපෝලියන් බොනපාට් හා තුවාලයක් සිදුරු වී ලේ ගැලීම හේතුවෙන් මිය ගිය කතුවර ජේම්ස් ජොයිස් ඇතුලත් වෙති.

මෙම රෝගය මුලින්ම හඳුනාගත් දහනවවන ශතවර්ෂයේ පටන් උදරීය බිත්ති ක්ෂය කරන ආමාශයික අම්ලයේ අධිකතාව හේතුවෙන් ජීර්න පද්ධතිමය තුවාල ඇති කරනු ලබන බැව් විශ්වාස කරන ලදි. එමනිසා ප්‍රතිකාර පදනම් කරන ලද්දේ ප්‍රති - අම්ල (භාෂ්මික) ඖෂධ මගින් අම්ල වර්ධනය විමපාලනය කිරීමක් උදරීය අම්ල මට්ටම වැඩි කිරීමට හේතු වන දුම්පානය ද ආතතිය ද අඩු කිරීම මතයි. අම්ල වර්ධනය වීම හා උදරීය බිත්ති වැඩිදුර සිදුරු වීම නැවැත්වීමට තුවාලය වටා ඇති ස්නායු සැත්කමකින් කපා වෙන් කිරීම අවසාන ප්‍රතිකාරයකට ඇතුලත් විය.

වෛද්‍ය ප්‍රජාව පෙලූ එක් ගැටලුවක් දිගටම පැවතුනි. තුවාලයක් අම්ලය වර්ධනය වීම මගින් හට ලන්නේ නම් ප්‍රතිකාරයෙන් පසු වහාම එය නැවත හට ගන්නේ ඇයි ? උදරයේ ඇති අධිආම්ලික පරිසරය තුල බැක්ටීරියාවකට දිගටම පැවතිය නොහැකිය යි විද්‍යාඥයින් සිතූ නිසා එවැන්නක් හේතු වේ යයි සලකනු ලැබුවේ නැත. ආහාර ද ක්ෂුද්‍රජීවීන් සියල්ලක්ම පාහේ ද ජීර්නය කරනු ලැබිය හැකි සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් අම්ලය හා ජීර්නක එන්සයිමවලින් සමන්විත ආමාෂයික අම්ල ගැලුමකින් පමන දිනපතා උදරය නැහැවේ.

ඔප්පු කල පරිදිම හෙලිකොබැක්ටර් පයිලෝරි සුවිශේෂී වූවකි. එය අම්ලය උදාසීන කිරීමට හේතුවන ආරක්ෂක "වලාකුලු" වර්ගයක් වර්ධනය කරයි. ආරක්ෂා කල විට සාමාන්‍යයෙන් නිරීක්ෂනය නොවන ඉදිමීමක් ඇති කරමින් එය උදරීය බිත්ති ආසාදනය කරයි. එහෙත් සියයට 15කට ආසන්න සිද්ධීන් ගනනක දී ඉදිමීම තුවාලයක් බවට් උදරීය බිත්ති සිදුරු වී ලේ ගැලීම ඇති කල හැකි් වර්ධනය වේ.

බටහිර ඔස්ට්‍රේලියාවේ රාජකීය පර්ත් රෝහලේ ව්‍යාධිවේදියෙකු වන වොරන් 1979 දී ප්‍රථම සොයාගැනීම කලේ ය. බ්‍රිතාන්‍ය වෛද්‍ය විද්‍යාත්මක සඟරාවක් වන ලාන්සේ වෙත අදහස් දක්වමින් ඔහු කීවේ: "මම කරමින් සිටියේ මගේ දෛනික ව්‍යාධිවේදී කටයුතු පමනයි. විමතිය දනවන දේ සෙවීමට කැමති මම මෙදින එවැනි දෙයක් දුක කුතුහලයෙන් ඒ දෙස බැලීම ආරම්භ කලෙමි." 1979 දී ආමාශයික ජීවපටකයක් පරීක්ෂා කිරීමේ දී උදරීය බිත්ති සමග සමීපව ස්පර්ශ වී තිබෙන බැක්ටීරියා අනේක ප්‍රමානයක් ඔහු සොයා ගත්තේ ය. "දූෂකයක් නොවූ ඒවා ක්‍රියාකාරීව වර්ධනය වීම පෙනෙන්නට තිබුනි" යයි ඔහු කීවේ ය.

උදරාම්ලයේ විනාශකාරීභාවය නිසා ව්‍යාධිවේදීන්ට උදර බිත්ති අධ්‍යයනය කිරීමට ලැබෙන අවස්ථාව විරල වන තතු තුල ආමාශයික පටක අධ්‍යයනය - උදරීය පටක පිලිබඳ අධ්‍යයනය - වසර ගනනාවක් පුරා රොබින් වොරන්ව ඇද බැඳ තබාගෙන තිබේ. අන්වීක්ෂය හරහා ජීව පටක හොඳින් දුක බලාගැනීම සඳහා වර්නක සමගින් පර්යේෂන ඇරඹූ ඔහු හෙලිකොබැක්ටර් පයිලෝරි රිදී සමගින් හොඳින් වර්න ගැන්වෙන බව සොයා ගත්තේ ය. බැරී මාර්ෂල් මුනගැසීමට පෙර වසර දෙකකට ආසන්න කාලයක් ඔහු තම පර්යේෂන කර ගෙන ගියේ ය. අතිශය වැදගත් වෛද්‍ය විභාගයක් සමත් වීම සඳහා පුහුනුවන්නකු වූ මාර්ෂල්ට පර්යේෂන ව්‍යාපෘතියක් අවශ්‍ය විය.

ගුප්ත බැක්ටීරියාව සහිත රෝගීන්ගේ සායනික දත්ත රැස් කිරීමට එක්ව වැඩ කිරීම ඇරඹූ මාර්ෂල් සහ වොරන් ජීව ද්‍රව්‍ය වගා කොට පරීක්ෂා කිරීම ද ඇරඹී ය. බොහෝ ඒවාට වඩා මෙම බැක්ටීරියාව ප්‍රති උත්පාදනය වීමට කල් ගතවූ නිසා සාමාන්‍ය වගා කිරීමේ ක්‍රම සාර්ථක වූයේ නැත. අහම්බයකින් එක් දිගු සති අන්තයක් පුරා වගා කරන බඳුන් හැර දමනු ලැබ තිබුනි. මෙහි ප්‍රතිඵලය වූයේ බැක්ටීරියාව් හෙලිකොබැක්ටර් පයිලෝරි නමින් හඳුනාගනු ලැබූ් වර්ධනය වීමක් හා අවසානයේ ඒකලිත වීමක් ය.

ඊලඟ පියවර වූයේ බැක්ටීරියාවක් ආමාශයික ප්‍රදාහයක් අතර සම්බන්ධතාව පෙන්වා දීම යි. ඍජුවම බැක්ටීරියාව පැවතීම හේතුවෙන් ආමාශයික ප්‍රදාහයෙන් පෙලුනු 65ක් දෙනකු ද ඇතුලත් රෝගීන් 100ක් සම්බන්ධ කර ගත් අධ්‍යයනයක් මෙම විද්‍යාඥයන් දෙදෙනා විසින් මෙහෙයවනු ලැබීය. ගසනීය තුවාල සහිත රෝගීන් සියලු දෙනා හා ආමාශයික තුවාල සහිත රෝගීන්ගෙන් සියයට 80ක් දෙනා තුලත් සර්පිලාකාර ජීවී හෙලිකොබැක්ටර් පයිලෝරි තිබිනි.

විද්‍යාත්මක නිරවද්‍යතාව සඳහා, බැක්ටීරියාවෙන් ආසාදනය වූ සජීවී සත්වයෙකුට ගැස්ට්‍රයිටිස් වැලඳෙන බව පෙන්වීමට මාර්ෂල් සහ වොරන්ට අවශ්‍ය විය. අවාසනාවන්ත ලෙස පරීක්ෂනය සඳහා භාවිතා කල සත්ව මාදිලිය ලඳරු ඌරු පැටවුන් වූ අතර ඔවුන්ගේ උදරයන් ඇතුලත පරීක්ෂා කිරීම සම්පූර්නයෙන්ම පාහේ කල නොහැක්කක් විය.

එවිට මාර්ෂල් කලේ පර්යේෂනයට භාවිතා කරන ඌරා ලෙස තමන්ව ම භාවිතා කිරීමේ අසාමාන්‍ය පියවර යොදා ගනිමින් අලුතෙන් සොයා ගත් බැක්ටීරියාව අඩංගු ද්‍රාවනයක් පානය කිරීම යි. "මා තුලම තුවාලයක් ඇති කර එයට ප්‍රතිකාර කොට සාමාන්‍ය ජනයා තුල රෝග කාරකය විය හැක්කේ හෙලිකොබැක්ටර් පයිලෝරි බව ඔප්පු කිරීමට මම සැලසුම් කලෙමි" යි ඔහු එක් සම්මුඛ සාකච්ඡාවකදී විස්තර කලේ ය. ඔහුට තුවාලයක් හට නොගත් නමුත් ඇතිවූ උදර ඉදිමුම, ලාක්ෂනික වටකුරු බැක්ටීරියාව මගින් පැහැදිලිව ම වටලනු ලැබ තිබිනි.

විද්‍යාඥයෝ දෙදෙන තම සොයාගැනීම් 1984 දී ලාන්සේහි පල කලහ. තම 90 වන සංවත්සරය සැමරීම සඳහා මෑතක දී ලන්සේ සඟරාව විසින් කරන ලද විශ්ලේෂනයකදී, මාර්ෂල් හා වොරන් විසින් ඉදිරිපත් කරන ලද ලිපි එහි වඩාත්ම අවධානයට ලක් වූ ලිපි 10 අතුරින් පිලිවෙලින් දෙවන හා තුන්වන ස්ථානය ලබා ගත් බව පෙන්වා දුනි. එහෙත් තුවාලවල මෙම බැගුබැල්මට පෙනෙන සරල හේතුව පිලිගනු ලැබීමට පෙර තමත් වසර ගනනාවක් ගතවිය.

අසහනකාරීත්වය දුරලීම සඳහා ප්‍රති ආම්ලික පෙති නිෂ්පාදනය මගින් අධික ලාභ රැස් කර ගන්නා ඖෂධ සමාගම් මෙම සොයාගැනීම්වලට විශේෂයෙන් ම සතුරු විය. "ටැගමට්" හා "සැන්ටැක්" වැනි තුවාල ප්‍රතිකාරක විකිනීම තුලින් ඩොලර් බිලියන 8කට අධික වාර්ෂික ආදායමක් උපයා ගැනීමට ග්ලැක්සෝස්මිත්ක්ලයින් හා ඇස්ට්‍රා වැනි සමාගම් සමත්ව තිබුනි. මෙම රෝගීන්ගෙන් සියයට 95ක් තරම් ප්‍රමානයකට වසරක් තුල නැවතත් රෝග ලක්ෂන මතු විය.

1998 දී පැවති සම්මුඛ සාකච්ඡාවේදී මාර්ෂල් විස්තර කල පරිදි: ආමාශආන්ත්‍රයික විද්‍යාඥයන් හා බොහෝ ඖෂධ සමාගම්වල ජීවිකාව ඩොලර් බිලියන ගනන් වටිනා, තුවාල ඇති මිනිසුන් මිලියන ගනනකට ප්‍රතිකාර කිරීමට භාවිතා කරන මෙම ඖෂධ මත රඳා පවතී. " රෝග ලක්ෂන නැවත මතු වූ විට ජනතාවට කියනු ලබන්නේ නව ඖෂධයක් භාවිතා කරන ලෙසයි.

"ඉහල මට්ටමේ අලෙවියක් ඇති, ඔබ ඔබගේ ඉතිරි ජීවිත කාලයට ම දිනපතා ගතයුතු කොලෙස්ටරෝල් ඖෂධ, දියවැඩියා ඖෂධ වැනි ඖෂධ වර්ග ඔබට විකිනීමට ඖෂධ සමාගම්වලට අවශ්‍යය. ඔවුන් ඔබට ඔබගේ රෝගය සුවකරන්නා වූ ඖෂධ විකුනන්නේ නම් එය භාවිතා කල යුතු වන්නේ වරක් හෝ සතියක් පමනි. එසේ වුවහොත් ඒවායින් අධික ලාභ ලබන්නේ කෙසේ ද? මට නම් මහා පරිමාන ඖෂධ සමාගම්වලින් සහයෝගයක් නොලැබේ. මෙම තුවාල පිලිබඳ පර්යේෂනවලට අධික මුදල් ප්‍රමානයක් යොදවන් නමුත් මෙම බැක්ටීරියා වර්ග පිලිබඳව නම් එය එසේ නොවේ." මෙසේ පැවසුවේ මාර්ෂල් ය.

ආමාශයික තුවාලවලින් සියයට 80ක් 90ක් දක්වා ප්‍රමානයකට ම හේතුවන්නේ හෙලිකොබැක්ටර් පයිලෝරි යයි අවබෝධ කරගැනීම මගින් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම විප්ලවීකරනයකට භාජනය කොට ඇත. බොහෝ අවස්ථාවලදී බැක්ටීරියාව මර්දනය කරනු ලැබීමටත් එය යලි උදරය තුලම ආක්‍රමනය කිරීම නැවැත්වීමටත් එක් ප්‍රතිජීවක ඖෂධ අනුක්‍රමයක් ප්‍රමානවත් වේ. හෙලිකොබැක්ටර් පයිලෝරි ආසාදනය හා සම්බන්ධ උදරීය පිලිකා හා අනෙකුත් රෝගාබාධ වර්ධනය වීම වැලැක්වීමට ද එවැනි ප්‍රතිකාරයක් සමත් වනු ඇත. පසු ගිය අර්ධ ශතවර්ෂය තුල උදරීය පිලිකා ප්‍රවනතාව අඩුවී ඇතත් තවමත් පිලිකා හේතුවෙන් ඇතිවන මරන මරනවලින් දෙවන තැන ගන්නේ උදර පිලිකා මරනයන් ය.

වොරන් දැන් විශ්‍රාමිකය. එහෙත් ඔස්ට්‍රේලියානු ඇබොරිජින් ප්‍රජාව අතර හෙලිකොබැක්ටර් පයිලෝරිවල බලපෑම පිලිබඳ පර්යේෂන මාර්ෂල් විසින් දිගටම කරගෙන යනු ලැබේ. බොහෝ කොටම දිලිඳුබව සනීපාරක්ෂක ක්‍රම නොමැතිකම හා අධික ජනගහනය ආදිය නිසා ඕස්ට්‍රේලියානු ජනගහනය හා සසඳනවිට ඇබොරිජින්වරු අතර ඉතා ඉහල ආසාදන ප්‍රවනතාවක් පවතී. තුවාල හා ආන්ත්‍රයික පිලිකා ඇතිවීමේ ඉහල අවදානමක් ඇති ඇබොරිජින් ජනයාගේ අයහපත් සෞඛ්‍යතත්වයට ආසාදන තත්වය සැලකිය යුතු දායකත්වයක් දක්වන අංශයක් වේ.

පසු ගිය වසරේ පල කෙරුනු පර්යේෂන පත්‍රිකාවක මාර්ෂල් සඳහන් කලේ: "අපගේ අධ්‍යයනය හෙලිකොබැක්ටර් පයිලෝරි ආසාදනය පිලිබඳ වැඩිදුර තොරතුරුවල අවශ්‍යතාවය හෙලිදරව් කරයි. මෙවැනි වර්ගයේ ආසාදන නිසි පරිදි කලමනාකරනය කිරීම සඳහා පවත්නා රෝග විනිශ්චය ක්‍රම මෙහෙයවීමට අවශ්‍යය. කෙසේ වුවත් මෙහි තේරුම වන්නේ සෞඛ්‍යයසඳහා වෙන් කරන මුදල් ප්‍රමාන ඉහල දැමිය යුතු බවයි." මෙම මූලික සොයා ගැනීමට හේතු වූ පර්යේෂනය වැනි දීර්ඝකාලීන පර්යේෂනවලට ආන්ඩුවලින් මුදල් වෙන් නොකිරීම ඔහුගේ විවේචනයට ලක් විය. "බොහෝ පර්යේෂන මුදල් ප්‍රමානවත් වන්නේ යන්තම් වසර දෙකකට පමනි." යයි ඔහු කීය. "විසඳීමට තරම් වැදගත් ගැටලුවක් තිබේ නම් එය දිගටම කරගෙන යාමට සමත් විය යුතු ය."

මාර්ෂල් හා වොරන් මුල පටන් ම මුහුන දුන් දුෂ්කරතා මෙම අදහස් දැක්වීම් මගින් ඉස්මතු කර දක්වේ. මූල්‍යමය බාධාවන් හා තහවුරු වූ සංගත අවශ්‍යතාවලින් පැමිනි විරුද්ධත්වය ජයගෙන අවසානයේ දී නොබෙල් ත්‍යාගය දිනා ගැනීමට ඔවුන්ට හැකි විය. එහෙත් ඔවුන්ගේ කතාව සුවිශේෂී එකකි. අනෙක් බොහෝ විද්‍යාඥයෝ එතරම් වාසනාවන්ත නොවෙත්.

© www.wsws.org